අඟුරු තවරාගත් දෙදෙන සොරකම සඳහා හේනට රිංගුවෝය.

බසය උහුමීය හන්දියට ළඟාවෙනවිට නවස හමාර පමණ වී තිබුණි. බසයෙන් බැසගත් සිරිසේන විදුලි පන්දම දල්වා අතුරු පාරට පිවිසියේය. හේරත් මුදලාලිගේ කඩය පිටුපස නවතා තිබූ බයිසිකලය එළියට ගත් ඔහු ඊටඅමාරුවෙන් ගොඩවිය. වෙරිමත හේතුවෙන් ගිළිහුණු සමබරතාවය නිසා ඇතිවන අපහසුතා ආයාසයෙන් මඩිමින් , හේ බයිසිකලය පෑගුවේය. කණාමැදිරි එළියක් බඳු බයිසිකලයේ ලාම්පුවේ එළිය තරමක් ඉදිරියට විහිදී තිබිණ. ඉඳහිට වල්බාවෙකු, වල්ඌරකු හෝ ඌරුමීයකු පාරේ නැවතී බලා, යළිත් දඩිබිඩියේ පාර අද්දර පඳුරුවල සැඟවී ගත්තේය. වැල්ලේ එරෙමින් කැරකෙන බයිසිකලයේ පිටුපස රෝදයේ හුළං මඳ ගතියක් වූයෙන් තලහේන හන්දිය ආසන්නයට පැමිණි සිරිසේන බයිසිකලයෙන් බැස්සේය.

හේනට රිංගූ තිලකේ සහ සේන එහි තිබූ හොඳින් වැඩුණු මඤ්ඤොක්කා පඳුරු තෝරමින් ගලවන්නට විය. තවද තැනින් තැන වැවුණු වැල්වල තිබූ මහත්වූ කැකිරි ගෙඩි, වට්ටක්කා ගෙඩිද කඩා ඔවුන් රැගෙන ගිය ගෝණිවලට පිරෙව්වේය. පැයක් පමණ හේනේ රැඳුණ ඔවුන් දෙදෙනා ශක්තිමත් ලීයක දෙකොණේ ගෝනි දෙක එල්ලුවේය.

"හිටිං ටිකක් වෙලා ඉඳලයං.." මඳක් ගිමන් හැරීම සුදුසුයැයි සිතූ තිලකේ බිම ඇදි ගත්තේ පිපිඤ්ඤා ගෙඩියක් ද කමිනි.

"ඕං දැං බෙරේ ඇහෙනවා හරි හයියෙන්..." සේන ඈතින් අසෙන තොයිලෙට කන්දෙමින් කීවේය.

"ඕක ඉවරවෙනකොට එක දෙක වෙයි..."

"මේක මෙහෙමම පාළු වත්තෙ කමතට ගෙනියමු. හෙට උදේ පාන්දරම වීරඹුගෙදර පොළට ගෙනිහින් මිරිහංපිටියෙ තම්බි මුදලාලිට දෙමු" පිපිඤ්ඤා ගෙඩිය කා අවසන් වූ තිලකේ නැගී සිටිමින් කීවේය.

"එහෙනම් බයිසිකලේ බැඳං උදේම යමු..." සේනද නැගිට්ටේය.

තලහේනේ සිට අතුරු පාරට පැමිණි සිරිසේනගේ විදුලි පන්දම කනාමැදිරියෙකුට වඩා තරමක් එළිය දුන්නේය. මෙතෙක් ආ මග දිග එකදු මිනිස් පළුටක් හෝ නොවීය. අඩ සඳ එළියේ ඒමේ අත වැනෙන ගස් අතුවල සෙවනැලි අතර සැඟවී යමෙකු තමා දෙස බලා ඉන්නේ දැයි සිරිසේනට තිගැස්මක් ඇතිවිය.තවද ඉදිරියේ සොහොන් පිටියද හමුවන බව සිරිසේනට සිහිවිය. ඈතින් ඇසෙන තොවිල් පලේ යක්බෙරයත්, මායම්වන යකැදුරුගේ හූවත් සිරිසේන ගේ ගතෙහි හිරිගඩු නැංවිය. වෙල පාවුලින් නරි රංචුවකගේ මූසල හැඬීමත්, කොස් ගස්වල වසා උන් වසා මා වවුලන්ගේ තටු ගැසීමේ හඬත් නිසා සිතට නැගුණු බිය තවත් වැඩිවිය. සිරිසේන නැවතී විදුලි පන්දමේ මුහුණතට එබුණි. එයින් ඉතා කුඩා එළියක් නැගිණ.
"ඉඳකිං මේකත් මෙතනම නිවුනනෙ ...."

අඩක් පෑයූ සඳ එළිය අතරින් එපිටින් පෙනෙන සොහොනේ සාදා තිබූ ගොක්කොල තොරණක කොටසක් සුළගේ ඒමේ අත වැනෙනු සිරිසේන දුටුවේ තමා දෙස බලා උන් කෙනෙකු තමන්ට අතවනන්නාක් ලෙසිනි. ඒ සමඟම දුටු දෙයින් හේ මහත් සේ තැතිගත්තේය.සොහොන් පිටිය දෙසින් අඩිපාරේ කදක් කරතියාගත් දෙදෙනෙකු තමා සිටි දෙසට එනු සිරිසේන දුටුවේය. ඔහුගේ අතපය වෙවුලා ගියේය. උගුරේ යමක් සිරවූ සේ දැනුණි.

'මේ මහ රෑ වෙන ඉතින් මොක්කුද?... මළමිනී එක්ක ඉන්න යක්කු... අම්මෝ මිනියක්ද කොහෙද කර තියා ගෙන එනව බුදු අම්මෝ...'

දෑතින් අල්ලා තමා දෙසට වාරු කර සිටි බයිසිකලය අත ඇරිණ, උණු වූ දියරයකින් දෙකකුල් තෙමීයනු දැනිණ. සිරිසේන සිහිසුන්ව හුන්තැනම ඇඳවැටුණෝය.
"මොකක්ද ඒ සද්දෙ.. තිලකයො.." සේන වේගය බාලකරමින් ඇසුවේය.
"මොකෙක් උණත් මෙතන තැක් ගැහෙක්ක බෑ යමං.." තිලකේ ගමන වේගවත් කළේය.
"ඔය බීපු එකෙක් බයිසිකලේඇවිල්ල පෙරළන්න ඇති... යමං ... යමං..."

පසුදා වටින් ගොඩින් එළිය වැටෙන්නත් පෙර ගමේ බොහෝ දෙනෙක් සිරිසේනගේ නිවස දෙසට දිවුවෝය.
"සිරිසේන උන්නැහේට යකා ගහළ කනත්ත ගාවදි...රෑ මුරකාරයා තමයි දැකල ගෙදෙට්ට ඇන්න ඇවිත් තියෙන්නේ"
කන්ද උඩ ගෙදරට ආප්ප රැගෙන යාමට පැමිණි ගැහැනියක නැන්දා සමඟ කීවාය.

"යකෝ ... ඉස්පිරිතාලෙ වැඩ කරන එකත් බලාගෙන ගියාම බය ගුල්ලෙක්ද? ..." නැන්දා ආප්පයකට පිටි වත්කරමින් ඇසුවාය.
"ඒ උනාට හාමිනේ එගොඩහ තොයිලෙකුත් තිබ්බනෙ හිත බය වෙන්ට..., ඒ නැතත් ඉස්සර ඕක අමු සොහොනක්නෙ"
"මේ බින්න ඇද නොබා ... උඹට ඔන ආප්ප ගාන කියහං..."

එදින දවස පුරාම සැමගේ මුවග රැඳුනු මාතෘකාව සිරිසේන දුටු හොල්මන් පිළිබඳ විය. ඇතැමුන් තම නිවෙස්වල සිටි ඇට්ටර ළමුන් බයකිරීම සඳහා,
"ඕං කෑගහපල්ලකො... සිරිසේන මාම දැකපු යක්කුන්ගෙ දිවවල් දනිස්සට දිගයිලු..." යැයි ඔවුන්ට කිවූහ.කුඩාවුන් ඇඟිලි මුවතුළ රුවාගෙන ඇස් මහත් කොට ඒ පුවත් ඇසුවේය.

වීරඹුගෙදර ගෙන ගිය මඤ්ඤොක්කා සහ අනෙකුත් දෑ කම්බි මුදලාලිගේ එළවළු බක්කියට විකුණූ තිලක සහ සේන තම බයිසිකල් හන්දියේ දමා කුරුණෑගල ගියෝය. එසේ ගිය දෙදෙනා යලි පැමිණියේ හොඳ හෝටලයකින් "බුරියානි" ද කා ඉම්පීරියල් එකෙන් 'ගාමිණී ෆොන්සේකා' රඟන අලුත් චිත්‍රපටියකුත් නැරඹීමෙන් අනතුරුවය.

එදින රාත්‍රියේ සිරිසේනට තොවිලයක් නැටීමට සියල්ල ඉතා කඩින් සූදානම් විය.අවට නිවැසියන්,හිතවත්හුද අවශ්‍ය දෑ සෙවීමට යුහුසුළු වූහ.කල් ඇතිව ඉහුම් පිහුම් කර, දරුවන්ට කන්න බොන්න දුන් ඇතැම් ගැහැණු හුළු අතුත් බැඳන් තොවිල්පලට ගියෝය. තොවිල් බලන්න යන සෙස්සෝ සමඟ තිළකත් සේනත් සිටියෝය.
"ඈබං .. තිලකයෝසිරිසේන අයියා එදා බය වෙලා තියෙන්නෙ උඹටයි මටයිවත්ද දන්නෙ නෑ නේද?..." සේන තිලකෙට ළං වෙමින් ඇසුවේය.
"කට වහගෙන හිටු... කාටවත් ඇහුනොත් සුං..." තිලක රවමින් කීවේය.
"වැඩිවෙලා මෙතන ඉන්න බෑ බං... ඊයෙත් නිදා ගත්තෙ නැති තරම්... එළිවෙනකං ඇහැරල උන්නා"

බෙර හඬ දැඩිව ඇසුණි, පොල්මල අතින්ගත් යකදුරා විවිධ යකුන්ගේ නම් ගම් කියමින් පරළවී නටන්නට විය. හිස සිට පොරවාගත් සිරිසේන ඒ අසල පැදුරක වාඩිවී උන්නේය. තිලකත් සේනත් ඈනුම් අරිමින් හිඳ පාර පැත්තට ආවේය.

බෙර හඬ ඇත්වෙත්ම කාගෙදෝ බැණ වැදීමක් ඇසෙන්නට විය. "පරබල්ලො...මගෙ හේන විනාස කරළා.. ඔය හු ...... පුතාල අහුඋනොත් මං ඔවුන්ගේ ඇට තලනව...." ඒ මුරකාරයා විය.

පසු දින සිරිසේන අවදි වූයේ කෙඩෙත්තුවට පත් ගතින් යුතුවය.ඉස්තෝප්පුවෙ දිග් බංකුවෙ හිඳ හේ ගුරුපාර දෙස බලා උන්නේය.

"ඉස්පිරිතාලෙට පණිවුඩයක් යැව්වා ... ඔන්න ඔහේ මේ දවස් දෙකත් ඉඳල යනව..." සිරිසේනගේ අතට තේ කෝප්පය දෙමින් සුමනා කීවාය.

මුරකාරයා සිරිසේනගේ නිවසට එනවිට ඔහු තේ බොමින් සිටියේය.
"මොකෝ දැං සිරිසේන උන්නැහේට?..." දන්නවැයි උඹහැට පෙනිල තියෙන්නේ යක්කු නෙවෙයි මගේ හේන පාළු කරපු හොරුද කොහෙද, හප්පේ මගේ හේන..."
"අනේ අම්මප... ඔය පාහරයි අහුඋනොත් දනී කරනදේ..." මුරකාරයා විට වට්ටිය රැගෙන පිලේ වාඩි විය.

ගතට සිහින් සීතලක් දැනුන හෙයින් සිරිසේන ගෙයි බෝල කූඩුවේ එල්ලා තිබූ බැනියම ඇඳගෙන යළිත් දිග් බංකුවෙ වාඩි වූවේය.
"ඔය විටේ පස්සෙ කාපං... තේකක් බීල ඉඳිමු" සිරිසේන මුරකරුට කීවේය.

හරකුන් දක්කාගෙන අල්ලපු වත්තට ඇතුළු වූ දෙදෙනා තිලක සහ සේන බව සිරිසේන ඈත දිම හැඳින්නේය. ඔවුන් දෙදෙනා සිරිසේන දෙස ඕනෑකමින් බලමින් වත්තේ කෙළවර නොපෙනී ගියෝය. මුරකරු නික්ම ගිය පසු සිරිසේන යළිත් ගෙට ගොස් ඇඳෙහි දිගාවිය. ඇඳට ඉහළ පොල් අතුවහලයේ සිදුරු අතරින් නැගුණු එළියේ දුම්රොටු පාවෙන දෙස ඔහු බලා සිටියේය.සුමනා වැට අයිනේ කා සමඟ දෝ විස්තර කතාබහ කරණු ඇසේ.

"දැන්නම් ගුණයි තිලක මල්ලියේ... මං හිතන්නේ නිදි වෙන්ටැ...."

ඒ හරක් බැඳ ආපසු පැමිනෙමින් උන් සේන සහ තිලකේ විය යුතු යැයි සිරිසේන සිතුවේය.




